# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 32 දරන
## මුදල් නීති (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 දෙසැම්බර් මස 20 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 23.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 9.00 යි.**

**2002 අංක 32 දරන මුදල් නීති (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී. ඕ. 51/2002.

**මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 32 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් නීති පනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— 422 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මහ බැංකුව පිහිටුවීම සහ එහි අරමුණු.

5. ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් ක්‍රමය පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ විධිමත් කිරීම සඳහා වගකිවයුතු අධිකාරියක් වශයෙන් (මෙහි මින් මතු "මහ බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුව නම් වූ ආයතනයක් මෙයින් පිහිටුවනු ලබන අතර, මේ පනතේ වෙනත් විධිවිධානවලට හානියක් නොමැතිව, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සම්පත් සංවර්ධනය කිරීමේ, දිරිගැන්වීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් පහත සඳහන් අරමුණු, එනම්-

(අ) ආර්ථික සහ මිල ස්ථායිතාව ; සහ

(ආ) මූල්‍ය ක්‍රම ස්ථායිතාව,

මේ පනතින් බලය දෙනු ලැබ ඇති ක්‍රියාමාර්ග මගින් හැකිතාක් දුරට සාක්ෂාත් කර ගැනීමේ කාර්ය භාරය මහ බැංකුව වෙත මෙයින් පවරනු ලැබේ.

2—H 017102—4,450 (2002/10)

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මේ පනත යටතේ අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හෝ ගනු ලැබිය යුතු ක්‍රියා මාර්ග තීරණය කිරීමට අමතරව මේ පනත යටතේ වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු අතර, එම බැංකුවේ කළමනාකරණය, මෙහෙයවීම් සහ පරිපාලනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය පොදුවේ වගකිව යුතු ය :

එසේ වුවද, උචිත යයි මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන්නේ නම්, 10 වන වගන්තියේ (අ), (ආ), (ආආ) සහ (ඇ) යන උපවගන්ති සහ 27 වන වගන්තිය මගින් මුදල් මණ්ඩලය වෙත පිරිනමන ලද හෝ පනවන ලද හෝ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත හෝ යම් නිලධරයකු වෙත හෝ ඒ නිලධරයන්ගේ කමිටුවක් වෙත පවරනු ලැබිය හැකි ය.";

(ආ) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) මුදල් මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ යම් බලතල, කාර්ය, හෝ කර්තව්‍ය පවරනු ලැබූ අවස්ථාවක, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් වෙත ද, ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම විසින් ඒ බලතල, කාර්ය හා කර්තව්‍ය මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට හෝ නියමු උපදෙස්වලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු ය";

(ඇ) ඒ වගන්තියේ (2) උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) ව්‍යවස්ථාදායක සභාවේ එකඟත්වය ඇතිව මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු" යන වචන වෙනුවට "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු" යන වචන වෙනුවට, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) ඔහු (ශ්‍රී ලංකා මහ බැංකුව හැර) යම් බැංකු ආයතනයක හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන හෝ පාලනය කරනු ලබන වෙනත් යම් ආයතනයක හෝ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකු හෝ කොටස් හිමියකු වන්නේ නම්, " .

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාගේ සහ" යන වචනවල සිට "ධුර

කාලය'' යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාගේ සහ (මෙහි මින් මතු පත් කළ සාමාජිකයකු යනුවෙන් සඳහන් කරනු ලබන) 8 (2) උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුගේ ධුර කාලය,'' :

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "පත් කළ සාමාජිකයා විසින්" යන වචන වෙනුවට "පත් කළ සාමාජිකයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "පත් කළ සාමාජිකයා" යන වචන වෙනුවට "පත් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "පත් කළ සාමාජිකයා" යන වචන වෙනුවට "යම් පත් කළ සාමාජිකයකු"යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "පත් කළ සාමාජිකයා" යන වචන වෙනුවට "පත් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය එහි "පත් කළ සාමාජිකයා'' යන වචන වෙනුවට "යම් පත් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "සාමාජිකයන් දෙදෙනෙක්" යන වචන වෙනුවට "සාමාජිකයන් තිදෙනෙක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ-

(i) "අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනකුගේ" යන වචන වෙනුවට "අවම වශයෙන් සාමාජිකයන් තිදෙනකුගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) "සාමාජිකයන් තිදෙනාගේ ම" යන වචන වෙනුවට "සාමාජිකයන් පස් දෙනාගේ ම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (9) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

10 (අ) (මෙහි මින් මතු "බැංකු පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 30 දරන බැංකු පනතේ 76ක වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, බැංකු පනතේ 76ක වගන්තියේ (3) සහ (4) වන උපවගන්තිවල කුමක් සඳහන් වුව ද සහ මේ උපවගන්තියේ (ii) ඡේදයට යටත්ව, ඒ බලපත්‍රලාභී විශේෂිත බැංකුව, බැංකු ආයතනයක් ලෙස සලකා මේ වගන්තියේ (3), (4), (5), (6), (7), (8) සහ (9) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ බැංකුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය ;

(ආ) මේ උපවගන්තියේ (i) ඡේදය යටතේ, මේ වගන්තියේ (3) උපවගන්තියේ විධිවිධාන අදාළවීම මගින් —

(i) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ගණන් බේරා වසා දැමීම නියම කරනු ලබන අවස්ථාවක, බැංකු පනතේ IXඅ කොටස යටතේ ඒ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය මුදල් මණ්ඩලය විසින් අවලංගු කළ යුතු අතර ඒ පනතේ VIII කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව ඇතුළත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බැංකුවක් සම්බන්ධයෙන් වන විට ඒ ගණන්

බේරා වසා දැමීම අනිවාර්ය ගණන් බේරා වසා දැමීමක් ලෙස සලකා ඒ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බැංකුවක් සම්බන්ධයෙන් වන විට ඒ බැංකුවේ කටයුතු අනිවාර්ය ගණන් බේරා වසා දැමීමක් හෝ ව්‍යාපාර කටයුතු වසා දැමීමක් ලෙස සලකා ඒ බැංකුව සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

(ii) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම නියම කරනු ලබන අවස්ථාවක, බැංකු පනතේ 76ග වගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත පවරා ඇති බලතල මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :

(ඇ) මේ උපවගන්තියේ "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" යන්නට බැංකු පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"බැංකු ආයතන ගණන් බේරා වසා දැමීම.

31. බැංකු ආයතනයක් ගණන් බේරා වසා දමන ලෙස නියම කරමින් 30 වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් නියමයක් කරනු ලබන අවස්ථාවක —

(අ) වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වන විට, බැංකු පනත යටතේ ඒ බැංකුව වෙත නිකුත් කර ඇති බලපත්‍රය මුදල් මණ්ඩලය විසින් අවලංගු කළ යුතු අතර ඒ පනතේ VIII කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව ඇතුළත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බැංකුවක් සම්බන්ධයෙන් වන විට ඒ බැංකුව අනිවාර්යයෙන් ගණන් බේරා වසා දැමීමක් ලෙස සලකා අදාළ විය යුතු අතර, ශ්‍රී ලංකාවෙන්

බැහැර සංස්ථාගත කරන ලද බැංකුවක් සම්බන්ධයෙන් වන විට ඒ බැංකුවේ කටයුතු අනිවාර්යයෙන් ගණන් බේරා වසා දැමීමක් හෝ ව්‍යාපාර කටයුතු වසා දැමීමක් ලෙස සලකා ඒ බැංකුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය ;

(ආ) 30 වන වගන්තියේ (10) වන උපවගන්තිය අදාළ වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් නොවන වෙනත් යම් බැංකු ආයතනයක් සම්බන්ධයෙන් වන විට, ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඇවරකරුවකු ලෙස යම් තැනැත්තකු නම් කරනු ලැබිය යුතු අතර ඒ නම් කිරීමට යටත්ව ඒ ආයතනයට අදාළ නීතියට අනුකූලව ඒ ආයතනය ගණන් බේරා වසා දැමිය යුතු ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

"මාසික ප්‍රකාශය.

34. සෑම මාසයකම අවසාන දිනයේ දී මහ බැංකුවේ වත්කම් හා බැරකම්වල ප්‍රමාණය සහ සංයුතිය පෙන්නුම් කරන සාමාන්‍ය ශේෂ පත්‍රයක් ඊට පසුව එළඹෙන මාසයේ අවසාන දිනයට පෙර මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මුදල් සැපයුම යන යෙදුමෙහි අර්ථ නිරූපණය.

62. මේ පනතේ කාර්ය සඳහා "මුදල් සැපයුම" යන යෙදුමෙන්, සියලු ව්‍යවහාර මුදල්, ඉල්ලුම් තැන්පතු, කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු සහ කලින් කල මුදල් මණ්ඩලය විසින් නියම කරනු

ලැබිය හැකි වූ සහ ආණ්ඩුව, වාණිජ බැංකු සහ මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි මූල්‍ය ආයතන හෝ මූල්‍ය ආයතන වර්ග හැර වෙනත් තැනැත්තන්ට අයත්ව තිබෙන්නා වූ වෙනත් යම් මූල්‍ය වත්කම් අදහස් වන අතර, මේ වගන්තියේ කාර්ය සඳහා "මූල්‍ය ආයතන" යන්නට 93 වන වගන්තියේ (5) උපවගන්තියේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ III වන පරිච්ඡේදයෙහි III වන අලුත් කොටස ඇතුළත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස මෙයින් ඇතුළත් කරනු ලැබේ :—

"III වන කොටස- ගෙවීමේ සහ බේරුම් කිරීමේ ක්‍රම.

අරමුදල් මාරුකිරීම සඳහා සහ සහතික රහිත පුරුකුම්පත් මාරු කිරීම සහ බේරුම් කිරීම සඳහා ක්‍රම ඇති කිරීම.

62අ (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්—

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමග බේරුම් කිරීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලබන සහ එම බැංකුව විසින් සහභාගිකරුවන් ලෙස ක්‍රමයට ඇතුළත් කර ගන්නා ලද වෙනත් ආයතන හෝ තැනැත්තන් විසින් සහ ඔවුනොවුන් අතර අරමුදල් මාරු කිරීම සඳහා ;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව සහ සෘජු සහභාගිකරුවන් විසින් සහ ඔවුනොවුන් අතර සහතික රහිත පුරුකුම්පත් මාරු කිරීම සහ බේරුම් කිරීම සඳහා ;

(ඇ) (ආ) ඡේදය යටතේ සහතික රහිත පුරුකුම්පත් මාරු කිරීම සහ බේරුම් කිරීම සම්බන්ධයෙන් ගෙවීමේ වගකීම් නිරවුල් කිරීම සඳහා,

ක්‍රම එකක් හෝ ඊට වැඩි ගණනක් ඇති කර ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඇතිකරන ලද ක්‍රමයක්, ගෙවීමේ වගකීම හෝ පුරුකුම්පත්

නිශ්කාෂනය කිරීම හෝ බේරුම් කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් රටක පවතින වෙනත් ක්‍රමයකට සම්බන්ධ කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ක්‍රමයක සහභාගිකරුවන් සමග ගිවිසුම්වලට එළඹීමට ද, ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වන රීති ඒ ක්‍රමයේ සහභාගිකරුවන් වෙත ලිඛිතව නිකුත් කිරීමට ද ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත්තේ ය.

(4) (3) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව ඒ රීති මගින් —

(අ) සහභාගිකරුවන්ට, සුරැකුම්පත්වල සම පාර්ශ්විකයට එරෙහිව දින තුළ ණය පහසුකම් සැපයීම සහ එම ණය පහසුකම් සැපයුමට සම්බන්ධ කොන්දේසි ;

(ආ) ඉලෙක්ට්‍රොනික අත්සන් සම්බන්ධයෙන් සහතික කිරීමේ බලධරයන් පත්කිරීමට අදාළ යම් නීතියක් යටතේ, සහභාගිකරුවන්ට සහතික නිකුත් කිරීමේ කාර්ය සඳහා, සහතික කිරීමේ අධිකාරියක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව පත් කිරීම ;

(ඇ) සහභාගිකරුවන් සඳහා අචාරධර්ම පද්ධතියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඈ) ඉලෙක්ට්‍රෝනික ක්‍රම අනුව පවත්වාගෙන යනු ලබන ගනුදෙනු සත්‍යායනය කිරීම ;

(ඉ) මේ ක්‍රමයේ යහපත උදෙසා අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකනු ලබන්නේ නම් එම බැංකුව විසින් මේ ක්‍රමය ක්‍රියාත්මක වීම නැවැත්වීම හෝ අත්හිටුවීම නැතහොත් යම් සහභාගිකරුවකු හෝ සහභාගිකරුවන් වර්ගයක වරප්‍රසාද හෝ අයිතිවාසිකම්

ඉල්ලා අස්කර ගැනීම හෝ අත්හිටුවීම හෝ සහභාගිකරුවකුගේ ක්‍රම සාමාජිකත්වය අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම ;

(ඊ) බේරුම් කිරීමේ ක්‍රම සම්බන්ධයෙන් සහභාගිකරුවන් ක්‍රියා කරන පිළිවෙල විගණනය කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා විගණකවරුන් හෝ පරීක්ෂකවරුන් පත් කිරීම ; සහ

(උ) සහභාගිකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අය සහ ගාස්තු ගෙවීම,

සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(5) (අ) අරමුදල් මාරුකිරීම පමණක් සම්බන්ධයෙන් වූ ගණුදෙනුවක් පිළිබඳව වන විට, අරමුදල් මාරුකිරීම ඉල්ලා සිටින සහභාගිකරුගේ බේරුම් කිරීමේ ගිණුම හර කරනු ලැබීමේ දී ;

(ආ) සුරැකුම්පත් මාරුකිරීම පමණක් සම්බන්ධයෙන් වූ ගණුදෙනුවක් පිළිබඳව වන විට, සුරැකුම්පත් මාරුකිරීම ඉල්ලා සිටින සහභාගිකරුගේ සුරැකුම්පත් ගිණුම හර කරනු ලැබීමේ දී ;

(ඇ) අරමුදල් මාරු කිරීම සහ සුරැකුම්පත් මාරු කිරීම යන දෙකම සම්බන්ධයෙන් වූ ගණුදෙනුවක් පිළිබඳව වන විට, අරමුදල් මාරු කිරීම හෝ සුරැකුම්පත් මාරු කිරීම යන දෙකෙන් කලින් එළඹෙන දෙය ඉල්ලා සිටින සහභාගිකරුගේ අවස්ථාවෝචිත පරිදි බේරුම් කිරීමේ ගිණුම හෝ සුරැකුම්පත් ගිණුම හර කිරීමේ දී,

(1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ක්‍රමයක් හරහා කරනු ලබන ගෙවීමක් හෝ මාරුකිරීමක් අවසානාත්මක හා අවලංගු කළ නොහැකි වන අතර, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද ඒ ගෙවීම හෝ මාරුකිරීම ප්‍රතිවර්තනය කිරීමට, ආපසු ගෙවීමට හෝ අවහරණය කිරීමට නියම කරනු නොලැබිය යුතු ය. තවද, යම් අධිකරණයක් විසින් ඒ ගෙවීම හෝ මාරුකිරීම නිවැරදි කිරීම හෝ තාවකාලිකව නැවැත්වීම සඳහා ආඥා නොකළ යුතු ය.

(6) මේ පනත හෝ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද සහතික රහිත සුරැකුම්පත්, අවස්ථාවෝචිත පරිදි මේ පනත හෝ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ සාදන ලද නියෝග මගින් හෝ ඒවා යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට පමණක් පැවරීම, ඔඩපනය කිරීම, බැඳීම්වලට යටත් කිරීම, ණයට දීම, ණයට ගැනීම හෝ ගණුදෙනු කිරීම සිදු කළ යුතු ය. එසේ සිදු කරන ලද පැවරීමක්, ඔඩපනය කිරීමක්, බැඳීම්වලට යටත් කිරීමක්, ණයට දීමක්, ණයට ගැනීමක් හෝ ගණුදෙනුවක්, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, වලංගු සහ බලාත්මක විය යුතු අතර අදාළ විය හැකි නියෝගවලට අනුකූලව, සමපාර්ශ්වික ලෙස තබන ලද යම් සහතික රහිත සුරැකුම්පත් මත යම් ක්‍රමයක සහභාගිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් පෑමක්, එම ක්‍රමයට දායකයකු නොවන තැනැත්තකුගේ සහතික රහිත සුරැකුම්පත් මත ඉදිරිපත් කරන ලද හිමිකම් පෑමකට එරෙහිව ප්‍රමුඛත්වය ලබන්නේ ය.

(7) (1) උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ක්‍රමයක් හරහා සිදු කරන ලද මුදල් ගෙවීමකින්, මාරුකිරීමකින්, හෝ බේරුම් කිරීමකින් යම් පාඩුවක් හෝ අලාභයක් සිදු වූ තැනැත්තකු සඳහා ඇති වෙනත් යම් නීතිමය අයිතිවාසිකමකට හෝ

ප්‍රතිකර්මයකට (5) වන හෝ (6) වන උපවගන්තිවල සඳහන් කිසිවකින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

(8) සමාගම් ගණන් බේරා වසා දැමීමට අදාළ වූ යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද, යම් ක්‍රමයක සහභාගිකරුවකු ගණන් බේරා වසා දැමීම සඳහා නඩු කටයුතු ආරම්භ කර ඇත්නම් —

(අ) එම නඩු කටයුතු ආරම්භ වූ දිනයේ දී හෝ එදිනට පෙර උපචිත වූ වගකීම් සමථකර ගැනීම සඳහා මේ ක්‍රමයේ රීති මගින් අවසර දී ඇති හෝ නියම කර ඇති යම් දෙයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළ හැකි ය ;

(ආ) ක්‍රමයේ රීති යටතේ සමථකර ගන්නා ලද වගකීම්, නඩු කටයුතුවල දී සැලකිල්ලට නොගත යුතු ය ; තවද

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද සමථකර ගැනීම් සහ ක්‍රමයේ රීති යටතේ සහභාගිකරු විසින් කරන ලද යම් ගෙවීම් නඩු කටයුතුවල දී අවලංගු වියහැකි නොවන්නේ ය.

(9) සහභාගිකරුවකු ගණන් බේරා වසා දැමීම සඳහා නඩු කටයුතු ආරම්භ ව, ඒ සහභාගිකරුගෙන් අයවිය යුතුව තිබූ ගෙවීමක් හෝ බේරුම් කිරීමක් (5) වන හෝ (8) වන උපවගන්තිවල සඳහන් ආකාරයට සිදුකර ඇත්නම් සහ, මෙම ක්‍රමයෙන් පිටත වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ අරමුදල් හෝ සුරැකුම්පත් ගෙවීම හෝ බේරුම් කිරීම අවලංගුවිය හැකි හෝ අවලංගු වන අවස්ථාවක ඒ ගෙවීම හෝ බේරුම් කිරීම ක්‍රමයෙන් පිටත දී සිදු කළේ නම්, අයකරගත හැකි වන්නාවූ ප්‍රමාණයක් ඒ ගෙවීම හෝ බේරුම් කිරීම සිදු කරන ලද්දේ යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා ද, ඒ තැනැත්තාගෙන් සහභාගිකරුගේ ඈවරකරු විසින් අයකර ගනු ලැබිය හැකි ය.

(10) 47 වන වගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, යම් සහභාගිකරුවකු විසින් ක්‍රමය භාවිත කිරීම මගින් ඍජුව හෝ ඍජු නොවන ආකාරයකින් පැන නගින, යම් තැනැත්තකුට හෝ සහභාගිකරුවකුට විඳීමට සිදු වූ, යම් පාඩුවක් හෝ අලාභයක්, මුදල් මණ්ඩලයේ හෝ මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ නැතහොත් මුදල් මණ්ඩලයේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකුගේ නොසලකා හැරීමක් හෝ සිතාමතා කරන ලද විෂමාචාරයක් නිසා සිදුවූයේ නම් මිස, එම පාඩුව හෝ අලාභය සඳහා මුදල් මණ්ඩලය, මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකු, ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු නැතහොත් මුදල් මණ්ඩලයේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු වගකිව යුතු නොවේ.

(11) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ක්‍රමයක් හරහා සිදු කරන ලද යම් ගණුදෙනුවක් ඉලෝක්ට්‍රොනික ක්‍රමයක් මගින් සිදු කරනු ලැබූ අවස්ථාවක දී ඒ ගණුදෙනුව ඉලෙක්ට්‍රොනික ක්‍රම මගින් සිදු කරනු ලැබීම හෝ ඒ ගණුදෙනුවට අදාළ තොරතුරු ඉලෙක්ට්‍රොනික වාර්තාවක ආකාරයෙන් පවත්වාගෙන යාම යන හේතු නිසාම පමණක් ඒ ගණුදෙනුවට නෛතික බලපෑම, වලංගුභාවය හෝ ක්‍රියාවේ යෙදවීමේ හැකියාව ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු අතර ඒ වාර්තාව 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ II වන හා III වන කොටස්වල විධිවිධානවලට හෝ යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් ඉදිරිපිට පරිගණක සාක්ෂි ඉදිරිපත් කිරීමට අදාළව තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියකට හෝ අනුකූලව යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් ඉදිරිපිට පවත්වනු ලබන නඩු කටයුතුවල දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(12) (1) වන උපවගන්තියේ සඳහන් කර්තව්‍ය වලින් යම් හෝ සියලු කර්තව්‍ය මුදල් මණ්ඩලය විසින් පනවනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව මුදල් මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය පවරනු ලබන සංස්ථාපිත මණ්ඩලයක් මගින් ඉටු කරනු ලැබිය හැකි ය.

(13) මේ වගන්තියේ කාර්ය සඳහා —

"ඍජු සහභාගිකරු" සහ "සහතික රහිත සුරැකුම්පත්" යන්නට 112ඇ වගන්තියෙහි" ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"රීති" යන්නට මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන යම් රීති අදහස් වේ ;

(4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා සුරැකුම්පත් යන්නට සහතික රහිත හෝ අන්‍යාකාරයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් ඇතුළත් නොවිය යුතු බව හැර, "සුරැකුම්පත්" යන්නට 112ඇ වගන්තියේ ලබා දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"බේරුම් කිරීමේ ගිණුම" යන්නෙන්, මේ පනත යටතේ සහභාගිකරුවකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවත්වාගෙන යනු ලබන්නා වූ ද ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතිය ඇතිව ක්‍රමයේ කාර්ය සඳහා භාවිත කරනු ලබන්නා වූ ද ගිණුමක් අදහස් වේ ;

"සුරැකුම්පත් ගිණුම" යන්නෙන්, 112ඇ වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව සහභාගිකරුවකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවත්වාගෙන යනු ලබන ගිණුමක් අදහස් වේ.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට එහි (1) වන උපවගන්තිය 72 වන වගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ආ) නැවත අංක යෙදූ 72 වන වගන්තියේ "කරනු ලැබිය යුතුය" යන වචන වෙනුවට "කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්..

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 76අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 76අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"විනිමය අනුප්‍රමාණයන්ට අදාළව අධිපතිවරයාගේ බලතල.

76අ. (1) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගණුදෙනු සඳහා සාමාන්‍යයෙන් අවශ්‍යවන විදේශ ව්‍යවහාර මුදල්වල ශ්‍රී ලංකාවේ රුපියල සම්බන්ධයෙන් වූ සාම්‍යයන්, 73 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කිරීම අවස්ථානුකූල නොවන බව අධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, අධිපතිවරයා විසින් —

(අ) ඒ වගන්තිය යටතේ ඒ විදේශ ව්‍යවහාර මුදල්වල සාම්‍යයන් තීරණය කිරීමෙන් සහ සහතික කිරීමෙන් වැළකී සිටිය හැකි ය ; සහ

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තැන් ගණුදෙනු හෝ වෙනත් ගණුදෙනුවල දී මිල දී ගනු ලැබිය හැකි හෝ විකුණනු ලැබිය

හැකි අනුප්‍රමාණ තීරණය කරනු ලැබිය හැකි ය ; නැතහොත් තීරණය නොකරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව අධිපතිවරයා ක්‍රියා කරන අවස්ථාවක 73, 74 සහ 76 වන වගන්තිවල විධිවිධාන නීතිමය වශයෙන් බලාත්මකවීම හෝ ක්‍රියාත්මක වීම අවසන් විය යුතු ය.

(3) තැන් ගණුදෙනු හෝ වෙනත් ගණුදෙනුවල දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය මිලට ගැනීමේ හෝ විකිණීමේ අනුප්‍රමාණයන් අධිපතිවරයා විසින් (1) (ආ) උපවගන්තිය යටතේ නිශ්චය කරන අවස්ථාවක, ඒ තීරණය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) අධිපතිවරයා විසින් උචිත යයි සලකනු ලබන විදේශ ව්‍යවහාර මුදල්වලට පමණක් ඒ තීරණය කිරීම සීමා කරනු ලැබිය හැකි ය ;

(ආ) (1) (ආ) උපවගන්තිය යටතේ තීරණය කරනු ලබන අනුප්‍රමාණ, විදේශ මුදල් නෝට්ටු සහ කාසි මිල දී ගැනීම සහ විකිණීම් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු අතර එවැනි අවස්ථාවල දී එවැනි මිල දී ගැනීම් හෝ විකිණීම් පිළිබඳ අතිරේක වියදම් හෝ ඊට ආනුෂංගික වියදම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකි ය ;

(ඇ) විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් සැබවින් ම දරනු ලැබූ විදුලි පණිවුඩ ගාස්තු හෝ වෙනත් ගාස්තු හැර, ඒ මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් කොමිස් මුදලක් භාර ගැනීම හෝ කවර හෝ විස්තරයක ගාස්තුවක් පැනවීම හෝ මහ බැංකුව විසින් නොකළ යුතු ය ;

(ඈ) (1) (ආ) වන උපවගන්තිය යටතේ අධිපතිවරයා විසින් නිරණය කරන ලද ප්‍රමාණයන් ඔහු විසින් නිරණය කරනු ලැබිය හැකි සීමා තුළ වෙනස් කිරීම පිණිස නමින් හෝ නිලයෙන් යම් නිලධරයකුට ලියවිල්ලකින් බලය දීමට අධිපතිවරයාට බලය ඇත්තේ ය :

(ඉ) යම් විදේශ ව්‍යවහාර මුදලක් සම්බන්ධයෙන් (1) (ආ) වන උපවගන්තිය යටතේ අධිපතිවරයා විසින් නිරණය කිරීමක් කරනු ලබන එහෙත් යම් විශේෂ විදේශ ව්‍යවහාර මුදලක් සම්බන්ධයෙන් ඔහු විසින් ඒ උපවගන්තිය යටතේ නිරණය කිරීමක් කරනු නොලබන අවස්ථාවක, අධිපතිවරයා විසින් නිරණය කිරීමක් නොකරන ලද්දේ යම් විදේශ ව්‍යවහාර මුදලක් සම්බන්ධයෙන් ද, ඒ ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන්, අධිපතිවරයා විසින් (1) (ආ) උපවගන්තිය යටතේ නිරණය කිරීමක් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලට අදාළව, ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි පවතින නීතිමය අනුපාත මත පදනම්ව ආගණනය කරනු ලබන අනුප්‍රමාණයන් අනුව, එම ව්‍යවහාර මුදල් මිලට ගැනීම හෝ විකිණීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය හැකි ය.

(4) 1(අ) උපවගන්තිය යටතේ සාමාන්‍යයන් නිරණය කිරීමෙන් සහ සහතික කිරීමෙන් අධිපතිවරයා වැළකී සිටින සහ 1 (ආ) උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තැන් ගණුදෙනු හෝ වෙනත් ගණුදෙනු සඳහා විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අධිපතිවරයා විසින් නිරණය කරනු නොලබන්නා වූ ද අවස්ථාවක, අධිපතිවරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් උචිත යයි නිරණය

කරනු ලබන අනුප්‍රමාණ මත විදේශ විනිමය මිල දී ගැනීම සහ විකිණීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය හැකි ය.

(5) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය මිලට ගැනීම හා විකිණීම කරනු ලැබිය හැකි අනුප්‍රමාණයන් අධිපතිවරයා විසින් (1) (ආ) උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලබන අවස්ථාවක, යම් වාණිජ බැංකුවක් විසින් එතැන් විදේශ විනිමය මිලට ගනු ලැබිය හැකි අවම ප්‍රමාණය සහ යම් වාණිජ බැංකුවක් විසින් එතැන් විදේශ විනිමය විකුණනු ලැබිය හැකි උපරිම ප්‍රමාණය ද අධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(ආ) අධිපතිවරයා විසින්, (1) (අ) උපවගන්තිය යටතේ සාමාන්‍යයන් තීරණය කිරීමෙන් සහ සහතික කිරීමෙන් වැළකී සිටිනු ලැබ ඇති බව සහ, (1) (ආ) උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය මිල දී ගත හැකි හෝ විකිණිය හැකි අනුප්‍රමාණ එම අධිපතිවරයා විසින් නිශ්චය නොකරනු ලැබ ඇති බව ද නොතකා යම් වාණිජ බැංකුවක් විසින් එතැන් විදේශ විනිමය මිල දී ගනු ලැබිය හැකි අවම අනුප්‍රමාණය සහ යම් වාණිජ බැංකුවක් විසින් එතැන් විදේශ විනිමය විකුණනු ලැබිය හැකි උපරිම අනුප්‍රමාණය අධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය ;

(ඇ) මේ උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ තීරණය කරනු

ලබන අවම හා උපරිම අනුප්‍රමාණයන් කෙරෙහි සහ ඒවා සම්බන්ධයෙන්, (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය ;

(ඇ) මේ උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ කිසිදු තීරණය කිරීමක් නොකරනු ලැබ ඇති අවස්ථාවක, ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි ඒ ව්‍යවහාර මුදල සඳහා වූ විනිමය අනුප්‍රමාණයේ පදනම මත ආගණනය කරනු ලැබූ අනුප්‍රමාණයන් අනුව යම් වාණිජ බැංකුවක් විසින් එම ව්‍යවහාර මුදල් මිලට ගැනීම, විකිණීම හෝ යම් ගණුදෙනුවක් පවත්වාගෙන යාම හෝ කරනු ලැබිය හැකි ය.

(ඉ) වාණිජ බැංකු විසින් එතැන් විදේශ විනිමය මිලට ගනු ලැබිය හැකි සහ විකුණනු ලැබිය හැකි අවම සහ උපරිම අනුප්‍රමාණයන් පිළිබඳව (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ තීරණය කිරීමක් කරනු ලබන අවස්ථාවක —

(i) කිසිම වාණිජ බැංකුවක් විසින්, අදාළ විය හැකි පරිදි එම ඡේදය යටතේ නිශ්චය කරන ලද අවම ප්‍රමාණයට අඩු යම් අනුප්‍රමාණයක් අනුව එතැන් විදේශ විනිමය මිලට ගැනීම හෝ එසේ තීරණය කරන ලද උපරිම ප්‍රමාණය ඉක්මවන්නා වූ යම් ප්‍රමාණයක් අනුව එතැන් විදේශ විනිමය විකිණීම හෝ

නොකළ යුතු ය ; තවද, එම විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් සැබවින්ම දරනු ලැබූ විදුලි පණිවුඩ ගාස්තු හෝ වෙනත් ගාස්තු හැර ඒ මිලට ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් යම් කොමිස් මුදලක් භාර ගැනීම හෝ කවර හෝ විස්තරයක ගාස්තුවක් පැනවීම හෝ වාණිජ බැංකුවක් විසින් නොකළ යුතු ය ; සහ

(ii) කිසි වාණිජ බැංකුවක් විසින් කරනු ලබන නැත් ගනුදෙනුවක් නොවන කවර හෝ, විදේශ විනිමය ගනුදෙනුවක්, ඊට අදාළ විය හැකි පරිදි මේ උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ තීරණය කරන ලද අනුප්‍රමාණයෙන්, ගණුදෙනුවේ අතිරේක පිරිවැය, වියදම් හෝ අවදානම සැලකිල්ලට ගන්නා විට සාධාරණ ප්‍රමාණයට වැඩි වන්නා වූ ආන්තිකයකින් වෙනස් වන නැතහොත් තත් කාර්ය සඳහා අධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් ආන්තිකයක් වේ නම් ඒ ආන්තිකයකට වඩා වෙනස්වන යම් අනුප්‍රමාණයක් මත, නොකළ යුතු ය.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තියට පෙරාතුව ම එහි VI වන කොටසේ දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම.

"වාණිජ බැංකුවල සහ නියමිත මූල්‍ය ආයතනවල සංචිත විධිමත් කිරීම".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන් වගන්තිය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සංචිත අවශ්‍යතා.

93. (1) මූල්‍ය ක්‍රමයේ ණය කටයුතු මගින් උත්පාදනය වන මුදල්වල ප්‍රමාණය සීමා කිරීම සඳහා වාණිජ බැංකුවල සහ මුදල් මණ්ඩලය මගින් නියම කරනු ලැබිය හැකි වූ (මෙම කොටසේ "නියමිත මූල්‍ය ආයතන" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් මූල්‍ය ආයතනවල තැන්පතු වගකීම්වලට එරෙහිව සහ මුදල් මණ්ඩලය මගින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් මූල්‍ය වගකීම්වලට එරෙහිව සංචිත පවත්වාගෙන යා යුතු බවට මුදල් මණ්ඩලය විසින් ඒ වාණිජ බැංකුවලට සහ වෙනත් මූල්‍ය ආයතනවලට නියම කරනු ලැබිය යුතු අතර ඒ කාර්යය සඳහා සංචිත පවත්වාගෙන යාමට නියමිත තැන්පතු වගකීම්වල පන්ති සහ වෙනත් මූල්‍ය වගකීම්වල වර්ග, මූල්‍ය මණ්ඩලය මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාණිජ බැංකුවක් විසින් හෝ නියමිත මූල්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යා යුතු බවට නියමිත සංචිත ඒ ආයතනවල එක් එක් පංතිවල තැන්පතු වගකීම්වල සහ ඒ ආයතනවල එක් එක් වර්ගවලට අයත් වෙනත් මූල්‍ය වගකීම්වල ප්‍රමාණයට අනුපාතික විය යුතු අතර (4) වන උපවගන්තියට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ රුපියල් තැන්පතුවල ආකෘතියට අනුකූල විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නියමිත මූල්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් ඒ මූල්‍ය ආයතන විසින් සංචිත වශයෙන් පවත්වාගෙන යාමට නියමිත රුපියල් තැන්පතු තබා ගැනීමේ කාර්යය සඳහා පමණක් පවත්වාගෙන යා යුතු ය.

(4) මූල්‍ය මණ්ඩලය විසින්, ජාතික ආර්ථිකයේ සහ මෙරට බැංකු කටයුතුවල හා මූල්‍ය ක්‍රමයේ යහපත පිණිස, (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යාමට නියමිත සංචිතවල යම් කොටසක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රුපියල් තැන්පතු හැර වත්කම් ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා අවසර දෙනු ලැබිය හැකි ය.

(5) මේ කොටසේ-

"මූල්‍ය ව්‍යාපාර" යන්නෙන්, ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේ දී තැන්පතු මාර්ගයෙන් හෝ විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, බැඳුම්කර, සහතික, නෝට්ටු, වාණිජ පත්‍ර, මහජනයාගේ මුදල් ලබාගන්නා වෙනත් සමාන සාධන පත්‍ර නිකුත් කිරීම මගින් හෝ මහජනතාවගෙන් කිසියම් ආකාරයක මුදල් භාරගැනීම සහ ඒ මුදල්, සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් ණය මුදල් දීම සඳහා හෝ ව්‍යාපාරයක් ලෙස ඒ මුදල් තුන්වන පාර්ශ්වයන්ට හෝ තුන්වන පාර්ශ්වල සුබ සිද්ධිය සඳහා හෝ ලබා ගැනීමට සැලැස්වීම සඳහා, භාවිතයට ගැනීම අදහස් වේ.

"මූල්‍ය ආයතනය" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතින් අර්ථ නිරූපණය කර ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතින් අර්ථ නිරූපණය කර ඇති පරිදි මූල්‍ය සමාගමක් අදහස් වන අතර මූල්‍ය ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් ඊට ඇතුළත් වේ.

''වෙනත් මූල්‍ය වගකීම්'' යන්නෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ නියමිත මූල්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වන විට, එවැනි යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, බැඳුම්කර, සහතික පත්‍ර, නෝට්ටු, වාණිජ පත්‍ර හෝ මහජනයාගේ මුදල් ලබා ගන්නා වෙනත් යම් සහතික පත්‍ර හෝ නිකුත් කිරීම මගින් මහජනයාගෙන් යම් ආකාරයකට මුදල් ලබාගැනීමේ දී උපචිත කරගන්නා වූ (තැන්පතු වගකීම් නොවන) වගකීම් අදහස් වේ.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''මුදල් මණ්ඩලය විසින් සංචිත අනුපාත නියම කරනු ලැබිය යුතු බව.

94(1) 93 වන වගන්තිය යටතේ සංචිත පවත්වාගෙන යාමට නියමිතව ඇත්තේ යම් පංක්තියකට අයත් තැන්පතු වගකීම්වලට සහ යම් වර්ගයකට අයත් අනෙකුත් මූල්‍ය වගකීම්වලට එරෙහිව ද එකී එක් එක් පංක්තියට අයත් තැන්පතු වගකීම් සහ එක් එක් වර්ගයට අයත් අනෙකුත් මූල්‍ය වගකීම්වලට අදාළ සංචිත අනුපාත, මුදල් මණ්ඩලය විසින් නියම කළ යුතු අතර කලින් කල ඒවා වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) සංචිත අනුපාතයේ යම් වැඩිවීමක් සිදුකළ දිනයේ දී පැවති යම් වගකීමක් සම්බන්ධයෙන් අදාළ වන ඒ සංචිත අනුපාතයේ වැඩිවීම මූල්‍ය මණ්ඩලය විසින් ක්‍රම ක්‍රමයෙන් සිදු කළ යුතු අතර දින 30 ක එක් කාලසීමාවක් තුළ ඒකක සියයට හතරකට වඩා වැඩි නොවිය යුතු ය.

(3) විශේෂ අවස්ථානුගත කරුණු යටතේ හැර, සංචිත අනුපාතයක යම් වැඩිවීමක් බලාත්මක වන දිනය පිළිබඳව, දින 14 කට නො අඩු දැන්වීමක්,

වාණිජ බැංකුවලට සහ නියමිත මූල්‍ය ආයතනවලට ලබාදීමට මුල්‍ය මණ්ඩලය හැකි සෑම උත්සාහයක් ම දැරිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''සංචිත මත පොලිය ගෙවිය යුතු අවස්ථාව.

95. තැන්පතු වගකීම්වල යම් පංක්තියකට හෝ මූල්‍ය වගකීම්වල යම් වර්ගයකට එරෙහිව සංචිතයක් පවත්වාගෙන යා යුතු බවට යම් වාණිජ බැංකුවකට හෝ යම් නියමිත මූල්‍ය ආයතනයකට නියම කරනු ලැබ ඇති අවස්ථාවක මූල්‍ය මණ්ඩලය විසින් ජාතික ආර්ථිකයේ සහ මෙරට බැංකු කටයුතුවල හා බැංකු ක්‍රමයේ යහපත පිණිස එලෙස තීරණය කරනු ලබන්නේ නම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංචිතයක් හෝ එහි යම් කොටසක් වශයෙන් පවත්වාගෙන යනු ලබන මුදල් මත මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව අවස්ථාවෝචිත පරිදි, ඒ බැංකුවට හෝ ඒ මූල්‍ය ආයතනයට පොලී ගෙවනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''අවශ්‍ය සංචිත ගණනය කිරීම.

96.(1) වාණිජ බැංකුවක් විසින් හෝ නියමිත මූල්‍ය ආයතනයක් විසින් හෝ පවත්වාගෙන යාමට නියමිත සංචිත, මූල්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි පදනමක් මත ගණනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා , වාණිජ බැංකුවක හෝ නියමිත මූල්‍ය ආයතනයක ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රධාන කාර්යාලය සහ ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ ශාඛා සහ නියෝජිත ආයතන එක් ඒකකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.''.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සංචිත ඌනතාවල ප්‍රතිඵල.

97.(1) වාණිජ බැංකුවක් විසින් හෝ නියමිත මූල්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන සංචිත ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් 96 වන වගන්තිය යටතේ නියමිත පදනම මත පවත්වාගෙන යාමට නියමිත සංචිත ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි, ඒ වාණිජ බැංකුව විසින් හෝ නියමිත මූල්‍ය ආයතනය විසින් ඌනතාවෙහි ප්‍රමාණය මත මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පොලී ගෙවනු ලැබිය යුතු ය.

(2) වාණිජ බැංකුවක් හෝ නියමිත මූල්‍ය ආයතනයක්, 96 වන වගන්තිය යටතේ නියමිත පදනම මත ගණන් බලනු ලැබූ ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් පවත්වාගෙන යාමට නියමිත සංචිතවල ප්‍රමාණය ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට අපොහොසත් වන අවස්ථාවක දී මූල්‍ය මණ්ඩලය විසින් ජාතික ආර්ථිකයේ යහපත උදෙසා :-

(අ) ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ණය ලබාගැනීම හෝ ආයෝජනය කිරීම තහනම් කරමින් හෝ සීමා කරමින් ;

(ආ) කොටස් හිමියන්ට ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ ලාභාංශ ගෙවීමේ කාර්යය සඳහා ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ ශුද්ධ ලාභ සම්පූර්ණයෙන් ම හෝ එහි යම් නිශ්චිත කොටසක් යෙදවීම තහනම් කරමින්,

නියමයක් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තියේ 2 වන උපවගන්තියේ "මේ කොටසේ ඉහතින් වූ විධිවිධාන යටතේ" යන වචන වෙනුවට "මේ කොටස යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 98අ වගන්තිය ඇතුළත් කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 98අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

"බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ බලතල.

98අ (1) නියමිත මූල්‍ය ආයතනයක පොත්, ගිණුම් සහ ලේඛන, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පරීක්ෂා කිරීම හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකු ලවා පරීක්ෂා කිරීමට සැලැස්වීම, කරනු ලැබිය හැකි ය ; තව ද ඒ ආයතනය විසින් මේ පනතේ මේ කොටසේ විධිවිධාන අනුව ක්‍රියා කරන්නේ දැයි සහතික ලෙස දැන ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඒ පොත්, ගිණුම් ලේඛන හෝ තොරතුරු කලින් කල හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් තුළ දී සපයන ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඒ මූල්‍ය ආයතනයට හෝ එහි අධ්‍යක්ෂවරයන්ට හෝ නිලධරයන්ට නියම කරනු ලැබිය හැකි ය.

(2) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ අධ්‍යක්ෂවරයාට හෝ පරීක්ෂකවරයාට විරුද්ධ වන්නා වූ හෝ අවහිර කරන්නා වූ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 112අ වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 112අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් පැති සටහන ආදේශ කිරීමෙන් :-

"ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ගිණුම් පවත්වාගෙන යාම පිණිස ද, සහතික රහිත සුරැකුම්පත් සඳහා රක්ෂිතාගාරයක් ද සඳහා පහසුකම් " ;

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "පවත්වාගෙන යාම සඳහා" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට "පවත්වාගෙන යාම සඳහා ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ද, සෘජු සහභාගිකරුවන් ගේ ද, අලෙවිකාර සෘජු සහභාගිකරුවන් සම්බන්ධයෙන් වූ විට ඔවුන්ගේ ගණුදෙනුකරුවන් ගේ ද සහතික රහිත සුරැකුම්පත්වලට ඇති හිමිකම් ලේඛනගත කිරීම සඳහා රක්ෂිතාගාරයක් පවත්වාගෙන යාම සඳහා ";

(ඇ) "සෘජු සහභාගිකරු" යන්නෙහි අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :-

"අලෙවිකාර සෘජු සහභාගිකරු" සහ "සෘජු සහභාගිකරු" යන යෙදුම් සඳහා පිළිවෙලින් දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ සහ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම් පත් ආඥාපනතේ දී ඇති අර්ථම තිබිය යුතු ය ;

(ඉ) "ප්‍රාථමික අලෙවිකරු" යන යෙදුමෙහි අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :–

"ප්‍රාථමික අලෙවිකරු" යන්නට දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ සහ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 112ආ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 112ආ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"යම් සංස්ථාපිත මණ්ඩලයක් විසින් 98(1) සහ 112අ වගන්ති යටතේ පහසුකම් සැලසිය යුතු බව.

112ආ. (1) 98 වන වගන්තියේ (1) වන උප වගන්තියේ සහ 112අ වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුවද, මුදල් මණ්ඩලය විසින් පනවනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව 98(1) වගන්තියේ සහ 112අ වගන්තියේ සඳහන් කර්තව්‍ය සියල්ලම හෝ ඉන් යම් කර්තව්‍යයක් මුදල් මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය පවරනු ලබන සංස්ථාපිත මණ්ඩලයක් විසින් ඉටු කරනු ලැබිය යුතු ය :

(2) (1) වන උපවගන්තියේ සඳහන් සංස්ථාපිත මණ්ඩලයක් විසින්, ඒ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ගිණුමක් පත්වාගෙන යනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "30 වන වගන්තිය හෝ 32 වන වගන්තිය" යන වචනවල සිට "වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම" යන්න දක්වා ඇති සියලු වචන අතහැර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"30 වන වගන්තිය හෝ 32(2) වගන්තිය හෝ 45 වන වගන්තිය හෝ 46 වන වගන්තිය හෝ 50 වන වගන්තිය හෝ 98 අ(2) වගන්තිය කඩකිරීමේ හේතුවෙන් හෝ එකී වගන්ති පිළිපැදීම පැහැර හැරීමේ හේතුවෙන්, නැතහොත් 30 වන වගන්තිය හෝ 79(2) (ඇ) වගන්තිය හෝ 98අ (1) වන වගන්තිය හෝ 101 වන වගන්තිය හෝ 102 වන වගන්තිය යටතේ සාදන ලද යම් රීතියක් හෝ දෙන ලද යම් නියෝගයක්, ආඥාවක්, විධානයක් හෝ නියමයක් කඩ කිරීමේ

හේතුවෙන් හෝ ඒ අනුව කටයුතු කිරීම පැහැර හැරීමේ හේතුවෙන් වරදකට වරදකරු වන සෑම තැනැත්තෙක් ම'';

(ආ) ඒ වගන්තියේ (2) උපවගන්තිය–

(i) එහි (අ) ඡේදයෙහි ''රුපියල් දෙදහස් පන්සියයක්'' යන වචන වෙනුවට'' ''රුපියල් පන් ලක්ෂයක්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එහි (ආ) ඡේදයෙහි ''රුපියල් දස දහසක්'' යන වචන වෙනුවට ''රුපියල් පන්ලක්ෂයක්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (2) (අ) උපවගන්තියෙහි ''රුපියල් තුන් දහසක්'' යන වචන වෙනුවට ''රුපියල් පන් ලක්ෂයක්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ වගන්තියෙහි (3) උපවගන්තියෙහි ''රුපියල් පන්සියයක්'' යන වචන වෙනුවට ''රුපියල් එක් ලක්ෂයක්'' යන වචන ආදේශ කිරීමෙන්.

**30.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.